සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## සිංහල - I

12 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන උද්ධෘත කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) "එක් දවසක් කළයකින් පැන් හැරගනෙ පය සෝධන්නාහු පයට පැන් වත් කළහ. ඒ පැන් බිම මඳ තැනක් ගොසින් ලා බී ගියේ ය. දෙවන දවස් පය සේදූ පැන් ආදී දවස් පැන් ගිය තැන පැන් බීම යන්ට මඳ හෙයින් ඒ පන්වා මඳක් දුරු ව ගොසින් ලා බී ගියේ ය. තුන් වන දවස් පය සේදූ පැන් දෙදවස් ගිය තරමින් වඩා ගොසින් ලා බී ගියේ ය. පටාචාරා වහන්දෑ ද විවසුන් වැඩීමට අනෙක් අරමුණක් නො සොයා තුන් දවස් පය සේදූ පැන් ගොසින් සුන් ලෙස ම අරමුණු කරන දෑ ආදියෙන් දවස් මඳක් ගොසින් ලා සුන් පැන් සේ මේ සත්තු ආදී වයස උපන් තැන් පටන් තෙතිස් හවුරුද්ද ඇතුළතත් මියෙති. දෙවන දවස් මඳක් දුරට ගොසින් ලා සුන් පැන් සේ ම මධ්‍යම වයස් වූ තෙතිස පටන් සත් සැම දක්වා මේ අතුරෙන් මියෙති. තුන් වන දවස් සුන් පැන් මෙන් කෙළවර වයස් වූ සත් සැට පටන් සියය දක්වා මේ අතුරෙන් මියෙති."

(1) පටාචාරවගේ භාවනා අරමුණ වූයේ කුමන සිදුවීම් ද?

(2) ඇය මෙනෙහි කළ පරිදි සත්ත්වයා මිය යන වයස් කාණ්ඩ මොනවාද?

(3) 'විවසුන් වැඩීම' යනු කුමක්ද?

(4) 'මඳ තැනක් ගොසින් ලා' 'ගොසින් ලා' යන්නෙහි ව්‍යාකරණ ලක්ෂණ දක්වන්න.

(ලකුණු 04)

(ආ) "යටගිය දවස හිමාල පර්වත සමීපයෙහි සඳහත්තලා නම් මහවල නිසා අටදහසක් පමණ සදත්කුලෙහි උපන් ඍද්ධිමත් වූ, ආකාශයෙන් යන ගමන් ඇති ඇත් රැළෙක් විසූ හ. එකල්හි පුරාණ ලද පාරමිතා ඇති මහ බෝධිසත්ව තෙම යුථපති ඇති රජුට පුත් ව උපන්නේ ය. එතෙම රිදී පර්වතයක් සේ සර්වාංගයෙන් ධවල වූ ලාක්ෂරයයෙන් තෙත් වූ මුඛයක් හා පාදා ඇත්තේ ය. එතෙම මැත භාගයෙහි වැඩිවිය පැමිණියේ අට අසු රියන් පමණ උස ඇත්තේ ය."

(1) සදත් විලෙහි ඇතුන්ගේ ස්වභාවය කෙසේද?

(2) බෝධිසත්ත්වයෝ ඒ ඇති රැළෙහි කා හට දාව උපන්නේ ද?

(3) බෝධි සත්ත්වයන්ගේ දේහ ලක්ෂණ කෙසේ ද?

(4) 'යූථපති', 'සර්වාංගයෙන්', 'ධවල' යන පදවල අර්ථ ලියන්න. (ලකුණු 04)

(ඉ) "තවද 'තොපගේ අතිරක්ත වූ අධර යුග්මයෙහි රශ්මීන් රැඳුණ වූ දත්ත පන්තීහු විලිකුන් දෙළුම් බිජු පෙළක් මෙන් බබළන්නා හ. තවද අනංගයාගේ මාලිගා දොර නොහොත් රතිමැදිරි දොර, රන්යටෙක බඳනා ලද නිල් ධ්වජ දෙකක් හා සමාන වූ තොපගේ බැම සඟළ කාමී පුරුෂයන් තමා කරා කැඳවන්නාක් මෙන් විශේෂයෙන් බබළයි. තව ද මොනර පිල් කළඹක් මෙන් දික් ව අක්බඹරු වූ තොපගේ සමන් මල් රැසක් වැනි නිල් වූ කෙස්වැටිය සිසාරා පලඳනා ලද ඉද්දමල් දමින් ඉතා සිත්කලු ය. 'සොඳුර' තෙපි කිනම් ද? තොපගේ දෙමව්පියෝ කිනම්හු ද? තෙපි තාම සස්වාමික කෙනෙකු ද? ඒ හැම මට නොවළහා කියව' යි කීහ."

(1) විලිකුන් දෙළුම් බිජු පෙළක් මෙන් බබළන්නේ මොනවාද?

(2) බැම සඟළ උපමා වූයේ කුමකට ද?

(3) නො සඟවා පවසන්නට යැයි කියන්නේ මොනවාද?

(4) 'අතිරක්ත අධර යුග්මයෙහි' යන්නෙහි අර්ථය ලියන්න.

(ලකුණු 04)

(ඊ) (1)

| | |
|---|---|
| "පියකරු තෙනෙන් පැරදී පිවිසි | වන විල |
| පිවිතුරු හසුන් එන ලෙස යළි | ගෙදිගු විල |
| විසිතුරු මෙපුරවර අඟනන් වෙමින් | ලොල |
| පියයුරු පටින් බැඳ වසතී සිතේ | බල |
| කලා සපිරි සිසි වත මන | කලාවන් |
| නිලා තිබෙන බැම ඉඳුදුනු | පිලාවන් |
| දූලා තනන තන රන හස | පිලාවන් |
| බලා පයැ'ද යනු බැරි පුර | කලාවන්" |

(1) හංසයින් පරාජය වූයේ කුමකට ද?

(2) ඔවුන් නැවත ගෙන්වන්නට අඟනන් කුමක් කළේ ද?

(3) නගර ස්ත්‍රීන්ගේ බැම කවරකට උපමා කර තිබේ ද?

(4) 'ඉඳුදුනු පිලාවන්' 'රන හසපිලාවන්' යන්නෙහි අර්ථ ලියන්න.

(ලකුණු 04)

(2) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය ලියන්න.

(1) "නාන්ට බස්නා හසර කවරේද? කෙසේ තෙනක ස්නානය කරන්නේ ද?"

(2) "මුඹ තත්පර ව විචාරන පසු කිව මනා නොවේ ද?"

(3) "තෝ කවරක්ද? කොයින් ආ කෙනෙක් ද?"

(4) "ලැජ්ජ වෙන්ඩ එපා මම කා එක්කවත් කියන්නේ නැහැ."

(5) "මං හාල්ටික ලිපේ තියල පොල් ගාන්න බැලින්නම් පොල් නෑ."

(6) "කොහොමද නොගිහින්? මං ඉඳල පලක් නැනෙ."

(ලකුණු 08)

(උ) පහත දැක්වෙන කවිපෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

රන් හැට්ටය හැඳ
රන් පටියෙහි
දිග කඩුව බැඳ
අසුපිට නැගුණු කුමාරයා
ගම් නියම් ගම් රාජධානි
පසුකොට ගියේ ය
පස් වසක් ගමන් කළ ඔහු
විවාහ කොටගත් කුමරිය
ගෙන ඒමට
තව පස් වසක් ගත විය.
'එවැනි රුවක් නොදිටිමු'යි

ඈ ගෙනා දින
පුර වැස්සෝ කීහ.
එදින සවස් කල
පුර දොර අසළ දී
රජ ගෙදර
දොරටුපල්ලාගේ දුව
හදා
කුමරුට හමු විය.
'තී කවුරුදැ'යි
ඔහු විස්මයෙන් ඇසීය.
'තීගේ වැනි රුවක්
මම කිසි කලෙක නොදිටිමි'

(ලකුණු 16)

The National e-learning Portal for The General Education

(02) 'කතුහිමිගේ ප්‍රතිභාපූර්ණ රචනා කෞශල්‍යයත්, භාෂා නෛපුණ්‍යයත් නිසා සද්ධර්මරත්නාවලිය සදාතනික වටිනාකමින් යුත් සාහිත්‍ය කෘතියකි." උක්ත කියමන නිර්දිෂ්ට කතා දෙක ඇසුරින් විමසන්න.

(ලකුණු 15)

නැතහොත්

මිනිස් සිතුවිලිවල සංකීර්ණ ස්වභාවය මැනවින් විවරණය කිරීමෙහි ලා ජාතක කතාකරු දැක් වූ සාමර්ථ්‍යය නියමිත කතාවස්තු දෙක ඇසුරෙන් පිරික්සන්න. (ලකුණු 15)

(03) 'කුසලය හෝ අකුසලය, කුඩා එකක් වීම හෝ විශාල එකක් වීම අනිවාර්ය විපාක ගෙන දෙන්නකි.' මේ කියමන සද්ධර්මාලංකාරයේ ඔබට නියමිත කතා වස්තුව ඇසුරින් සනිදර්ශන ව විමසන්න. (ලකුණු 15)

(04) 'ගිරා සංදේශයේ එන වර්ණනා කතුවරයාගේ ප්‍රතිභාසම්පන්න කවිත්වය ප්‍රකට කරයි.' දූත වර්ණනය හා නගර වර්ණනය ඇසුරෙන් මේ කියමන සාකච්ඡා කරන්න. (ලකුණු 15)

(05) 'ඉතා සංවේදී කලාකරුවෙකුගේ ආධ්‍යාත්මික ප්‍රේමය 'මළගිය ඇත්තෝ' නවකතාවෙන් මැනවින් නිරූපිත ය.' විමසන්න. (ලකුණු 15)

(06) සමාජයේ විවිධ පුද්ගලයන් මුහුණ පාන ගැටලු පිළිබඳ ව නූතන කෙටිකතාකරුවා විවරණයක යෙදී ඇති අයුරු අදාළ කෙටි කතා දෙකක් ඇසුරෙන් විමසන්න. (ලකුණු 15)

(07) 'කොළඹ යුගයේ කාව්‍ය නිර්මාණකරුවන්ට ප්‍රධාන වශයෙන් වස්තු විෂය වූයේ ජාතික නිදහස, සමාජ ශෝධනය හා ස්වභාව සෞන්දර්යයයි.' ඔබට නියමිත පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් උක්ත කියමන විමසන්න. (ලකුණු 15)

(08) 'නාට්‍යෝචිත අවස්ථා බෙහෙවින් මතු කරමින් තම නිර්මාණ ඉදිරිපත් කර ඇති බව රත්නාවලි නාට්‍යය තුළින් පැහැදිලි වේ.' මෙය සනාථ කරන්න. (ලකුණු 15)

e-thaksalawa The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## සිංහල - II

**12 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- **පළමු කොටසේ පළමුවන ප්‍රශ්නය ද, දෙවන කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයේ සියලු ම අනුකොටස්වලට මෙම පත්‍රයේ ම පිළිතුරු ලියන්න.**
- **පළමු කොටස හා දෙවන කොටස පිළිතුරු පත් සමඟ අමුණා භාරදෙන්න.**

---

### I කොටස

---

- **එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැලපෙන පිළිතුර තෝරා ගෙන එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.**

(01) (1.1) තාලුජ අක්ෂරයක් නොමැති වරණය තෝරන්න.

(1) ත, ඩ, ණ, ශ, ජ (2) ප, ච, ය, ඉ, උ (3) ප, ධ, භ, ඬ, ඊ
(4) බ, හ, ඔ, ඍ, ඒ (5) ය, ඡ, ඤ, ඦ, අ (......)

(1.2) නම්‍ය ස්වර හා අනම්‍ය ස්වර පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) ඇ, ඉ, ස, සහ අ, උ, ඔ (2) අ, උ, ඔ සහ ඇ, ඉ, එ (3) උ, ඓ, ඇ සහ ඖ, උ, ඔ
(4) උ, එ, ඇ සහ අ, ඉ, එ (5) අ, උ, ඔ සහ ඖ, ඓ, ඇ (......)

(1.3) පහත දී ඇති ස්වර කාණ්ඩ පිළිවෙළින් නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.

ය, ර, ල, ව
ශ, ෂ, ස, හ, ෆ
ඞ, ඤ, ණ, න, ම
ඟ, ඦ, ඬ, ඳ, ඹ

(1) අන්තඃස්ථ අක්ෂර, අර්ධනාසික්‍ය අක්ෂර, ඌෂ්මාක්ෂර, අනුනාසික්‍ය අක්ෂර
(2) ඌෂ්මාක්ෂර, අන්තඃස්ථාක්ෂර, අනුනාසික්‍යාක්ෂර, අර්ධනාසික්‍යාක්ෂර
(3) අන්තඃස්ථාක්ෂර, ඌෂ්මාක්ෂර, අර්ධනාසික්‍යාක්ෂර, අනුනාසික්‍යාක්ෂර
(4) අන්තඃස්ථාක්ෂර, අනුනාසික්‍යාක්ෂර, ඌෂ්මාක්ෂර, අර්ධනාසික්‍යාක්ෂර
(5) ඌෂ්මාක්ෂර, අන්තඃස්ථාක්ෂර, අර්ධනාසික්‍යාක්ෂර, අනුනාසික්‍යාක්ෂර (......)

(1.4) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) කෘත්‍රිම, කැලණිය, බියගුළු, කැළඹීම (2) කළුරිය, පෙළඹීම, වළාකුළු, පිළියෙළ
(3) කඩුලු, මැතිනි, බලමුළු, මලමුත්‍ර (4) වෙලෙඳ, පළතුරු, බඩුමලු, බිළිඳා
(5) සංඝායනා, ප්‍රස්ථාව, මධ්‍යසාර, යථාර්ථය (......)

(1.5) අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා නැති පද පේළිය තෝරන්න.

(1) කතරගම, දංඕවිට, බදුල්ල, හික්කඩුව
(2) ඇපාගම, රිකිල්ලගස්කඩ, රෝහණපුර, ලේල්වල
(3) අනුරාධපුර, බුත්තල, ලබුතලේ, සීගිරිය
(4) ඕනෑගම, නීලම්මහර, රන්පොකුණුගම, සූරියගම
(5) ගාල්ල, දික්කුඹුර, නාගොල්ලාගම, ඊරියවැටිය (......)

(1.6) **ගයනුකිත්ත, රකාරාංශය, පාපිල්ල, රේඵය සහිත වචන අනුපිළිවෙලින් යෙදී ඇති** වරණය තෝරන්න.

(1) ඖෂධාලය, තර්කය, පුෂ්ප, වක්‍ර (2) ගෞතම, මෛත්‍රීය, රුවල, මහාමාර්ග

(3) සෞම්‍ය, ධර්මය, පුවක්, විචිත්‍ර (4) බෞතීස්ම, ක්‍රමය, වර්ධනය, නුවණ

(5) සු තු ය , මෞ ලි ම ං ග ල ්‍ය ය , සු ග න් ධ ය , අ පි ච ම් ී ය (......)

(1.7) **අගය වැඩිවන ආකාරයට නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.**

(1) සොළොස, දොළොස, අටළොස, තුදුස

(2) පන්සාළිය, එකුන්විසි, සූසැට, තෙසැත්තෑ

(3) එකුන්විසි, සූවිසි, සූසැට, එකුන්සිය

(4) එකුන්තිස්, දෙතිස්, තුන්තිස්, තෙළෙස

(5) සූවාසූ, සාළිස්, අටසාළිස්, එක්සියඑක් (......)

(1.8) පහත කියමන් අතරින් **සදොස් කියමන සහිත වරණය** තොරන්න.

(1) හල් අකුරකට පර ව යෙදෙන 'ය' කාරය වෙනුවට ලියනුයේ යංශය යි.

(2) 'ඖ' ස්වරය ව්‍යඤ්ජනයක් සමග සම්බන්ධ වූ විට සෑදෙන අක්ෂරය ලියා දැක්වීමට කොම්බුවක් ද යෙදේ.

(3) 'ඓ' ස්වරයට ඇත්තේ එක් කොම්බුවක් වුව ද එය ව්‍යඤ්ජනයක් සමඟ යෙදෙන විට කොම්බුව ද්විත්ව වේ.

(4) රේඵය යෙදෙන්නේ 'ර්' ශබ්දය දැක්වීම සඳහා ය.

(5) ව ච න ය ක මු ල ට ර කා රං ශ ය නො යෙ දේ . (......)

(1.9) මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) කලාතුරකින් සතත, අනවරත, අනුබද්ධ, නිති

(2) කළු ශුභ්‍ර, ශ්වේත, ඕදාත, ධවල

(3) අචල තතන, ලෙල, සල, වෙවුලුම්

(4) මිතුරු පිළිමල්, විරිදු, පරිවි, අමිතුරු

(5) ශෝකය අමොද, තිසුම්, ආනන්දය, ළසොව (......)

(1.10) මුලින් දැක්වෙන පදයට **සමානාර්ථ පදයක් ඇතුළත් නොවන පද** පේළිය ඇති වරණය තෝරන්න.

(1) චන්ද්‍රයා සසඳරා, නිසයුරු, ගහමිණි, උළිඳු

(2) පුබුදු මිණිමුතු, විකසිත, මිණිදැදිරි, පුල්

(3) සූර්යයා තික්මෙරද, ගිම්රැස්, ගහමඟ, නුබ

(4) ඉක්මන අනලස්, වෙලෙවි, යුහු, කඩිනම්

(5) වෘක්ෂ දුම්, ධ්‍රැම, පාදප, තුරු (......)

(1.11) එකිනෙකට **අනුරූප වන සේ වචන යෙදී ඇති** පදපේළිය තෝරන්න.

(1) කළුවර මන්දිරය, ව්‍යාකරණ ලකුණු, සූර්ය මඬල, තාරකා පෙළ

(2) ප්‍රධාන පුවත්, කර්තෘ මඩුල්ල, අහස් ගැබ, ප්‍රීතිවාක්‍ය

(3) ප්‍රවෘත්ති පත්‍ර, ශ්‍රව්‍ය කාව්‍ය, ප්‍රකාශන අංශය, ශුභමූර්තිය

(4) ධාරානිපාත වැස්ස, ප්‍රාචීන බස් ඉගෙනුම, පුලස්තිපුර රජදහන, නභෝගැබ

(5) දළදා මන්දිරය, සාරගර්භ දෙසුම, නෑ මිත්‍ර සමූහයා, අභිනව මැඳුර (......)

(1.12) **තත්සම වචනයක් ඇතුළත් නො වන පද පේළිය තෝරන්න.**

(1) ප්‍රවීණ, ප්‍රවාද, පණ්ඩිත, ආශ්චර්යය (2) විලෝචන, නිර්භය, වක්ත්‍රය, ප්‍රාතිහාර්යය

(3) මිත්‍රද්‍රෝහී, ජනතා, ධාරා, මුහුල (4) නිරවද්‍ය, පෞරුෂ්‍යය, ලෞකික, රෞද්‍ර

(1.13) **අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක්** සහිත පද පේළිය තෝරන්න.

(1) බඹුන්, සූරයෝ, වළස්සු, අඟනෝ (2) මිතුරෝ, විහඟුන්, තාරකාවෝ, තරඟකරුවෝ

(3) කොටින්, ගිරව්, දණ්ඩිපැටවුන්, මී ගොනුන් (4) වෙළෙන්දෝ, මැතිවරු, හංසයකු, මකුණෝ

(5) කිඳුරන්, සෙබළු, නැවියන්, දේශකයෝ (......)

(1.14) **උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත** පද පේළිය තෝරන්න.

(1) අනුගමනය, විචල්‍ය, සංගායනා, ප්‍රතිග්‍රහණ (2) අක්‍රමවත්, නිර්භය, අකලංක, උපදේශ

(3) අවගුණ, පරදුක්ඛ, අනුබද්ධ, නොමිනිස් (4) නිරූපමා, පරෝපකාර, උපග්‍රන්ථය, පරිවාස

(5) සංදේශ, අසාධ්‍ය, පරිකල්පනය, අතුලිත (......)

(1.15) **'නිසි පුළුලුකුළ රියසකයුරු තිසර තන'** යන්නෙහි <u>කළු කර ඇති පද</u> පිළිබඳ වඩාත් හොඳින් ගැලපෙන වරණය කුමක්ද?

(1) මෙහි සමාස පද දෙකක් හා සන්ධි පද දෙකක් ඇත.

(2) මෙහි සන්ධි පද දෙකක් හා සමාස පද තුනක් වේ.

(3) සියලු සමාස පද විශේෂණ විශේෂ්‍ය ගණයට අයත් වේ.

(4) සියලු සන්ධි පදවල ස්වර ලෝපය දක්නට ලැබේ.

(5) මෙහි සන්ධි හෝ සමාස පද හෝ නොමැත.
(......)

(1.16) ව්‍යාකරණානුකූල ව නො ගැළපෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) මෙන්, හෝ, කෙරෙන්, වනාහි

(2) දිගටි, දියඹ, ගුණවත්,පහටි

(3) ගමන්බිමන්, ඉවුම්පිහුම්, වස්දොස්, දරුමුණුබුරු

(4) ලියමන්, නැටිලි, ඉඳුම්, ගෙරවිලි

(5) පරදාර, විහග ගී, නිකෙලෙස්, තිනෙත් (......)

(1.17) **තද්ධිත පදයක් ඇතුළත් නො වන** පද පේළිය තෝරන්න.

(1) බුද්ධිමත්, කළටි, නෛතික, අයෝමය (2) රූමත්, ගැමි, දියණියෝ, සිටාණෝ

(3) ඒකීය, සෞන්දර්යය, භෞතික, ඇහැටු (4) කාලීන, දැහැමි, පාරම්පරික, කැබිලිති

(5) දානමය, ජනතා, කැහැටු, කොයිබ (......)

(1.18) පහත සඳහන් වැකිවල <u>තදකළු අකුරින් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය</u> පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

★ බැතිමත්හු සිරිපා **වඳින්නට** ගියෝ ය.

★ ගොවියා මඩ **සෝදාගෙන** නිවෙස කරා යයි.

★ සිඟිත්තා අත්පොළසන් **දෙමින්** සිනාසෙයි.

★ සඳ **නගිද්දී** කුමුදු පිපෙයි.

(1) අපර ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(2) අපර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(3) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

The National e-Learning Portal for The General Education

(1.19) පහත සඳහන් වාක්‍යවල අංකිත පදවල **නොගැළපෙන ව්‍යාකරණ අංගය** දැක්වෙන වරණය තෝරන්න.

(1) කොස් **අත්තෙහි** ගෙඩි පැසී ඇත. (ආධාර කාරකය)

(2) මගියා **දුම්රියෙන්** ගමන් කරයි. (කරණ කාරකය)

(3) දරුවා **දෙමව්පියන්ට** ගරු කරයි. (සම්ප්‍රදාන කාරකය)

(4) වඳුරා **ගසෙන්** බිමට පැන්නේ ය. (අවධි කාරකය)

(5) **ශිෂ්‍යයින් විසින්** වැඩිහිටියෝ පුදනු ලබති. (කර්ම කාරකය) (......)

(1.20) **ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය** තෝරන්න.

(1) ක්‍රීඩාලෝලීන් ජය ඝෝෂා පවත්වද්දී ක්‍රීඩකයෝ ජයග්‍රහණය සඳහා තරග වැදුණා හ.

(2) ඔහු ද, මම ද එක ම පන්තියේ මිතුරෝ වෙමි.

(3) ගුරුවරයෙක් වූ ඔහු දක්ෂ නළුවෙක් ද විය.

(4) මේ නිවසේ වසන්නේ කවරහු ද?

(5) පන්තියේ ශිෂයයන් ඇත. (......)

(ලකුණු 20)

---

## II කොටස

---

- **මෙම කොටසින් 2, 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

(02) (අ) පහත සඳහන් ඡේදය කියවා ඒ පිළිබඳව අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

'අලංකාර' යන ශබ්දයෙහි අර්ථය ද කලින් කල වෙනස් වූ බව පැරණි පොතපත හදාරන්නෙකුට පෙනී යයි. 'භාමහ' ආදීන් මෙම පදය භාවිත කළේ උපමා රූපාකාදී අර්ථාලංකාරයෙන් හා යමක අනුප්‍රාසාදී ශබ්දාලංකාරයෙනුත් පොදුවේ හඳුන්වන ජාති නාමයක් වශයෙනි. එසේ ද වුවත් 'දණ්ඩින්' ගේ භාවිතය අනුව මේ පදය මෙයට වඩා බෙහෙවින් පළල් අර්ථයක් දෙයි. කාව්‍යයේ ශෝභාව ඇති කරවන ධර්මයෝ යම් තාක් වෙත් ද ඒ සියල්ල ම අලංකාර හැටියට 'දණ්ඩීන්' කල්පනා කළේ ය. මෙසේ දණ්ඩීන්ගේ ව්‍යවහාරය අනුව උපමා යමකාදී ලක්‍ෂණ පමණක් නො ව ගුණ මාර්ගාදී කාව්‍යාංග ද අලංකාර වශයෙන් හැඳින්විය හැකි වේ. කාව්‍යය පාඨකයාගේ රුචිය දිනා ගැනීමට හේතුභූත වන ඕනෑ ම ලක්ෂණයක් මේ අයුරින් 'අලංකාර' යයි කිව හැකි ය. 'අලංකාර' යන පදයට වඩාත් පුළුල් අර්ථයක් දුන්නෙකිල වාමන නම් රීතිවාදියා. කාව්‍ය වූ කලී අලංකාර මගින් වටහා ගත යුත්තක් ය යනුවෙන් කී වාමන, අලංකාර යනුවෙන් අදහස් කළේ කාව්‍යය පුරා පැතිර පවතින සෞන්දර්යය නැතහොත් චමත්කාරයයි. මේ අලංකාරයට (සෞන්දර්යයට) හේතුභූත වන්නේ කාව්‍ය ගුණ විය හැකියි. නැතහොත් එහි රීතිය විය හැකියි. නො එසේ නම් උපමාදි උක්ති ක්‍රමයක් හෝ යමකාදී ශබ්ද ලක්ෂණයක් විය හැකියි. එසේත් නැත්නම් වෙනත් ඕනෑ ම කාව්‍යාංගයක් විය හැකියි. යම් යම් අවස්ථාවලදී මෙතරම් පෘථුල අර්ථයකින් වහරනු ලැබූ 'අලංකාර' පදය කල් යාමේදී නැවතත් පටු අර්ථයක් දීම සඳහා භාවිත කෙරිණි. පශ්චාත් කාලීන විචාර ග්‍රන්ථවල යළිත් මෙම පදය භාවිත කර ඇත්තේ අර්ථාලංකාර හා ශබ්දාලංකාර පොදුවේ හඳුන්වන ජාති නාමයක් වශයෙනි. එනම් භාමහ එම පදය භාවිත කළ අර්ථයෙනි.

(1) මේ ඡේදයේ 'අලංකාරවාදීන්' කී දෙනෙකු ගැන සඳහන්වේද? ඔවුන් නම් කරන්න.

(2) මෙහි දැක්වෙන ආකාරයට 'අලංකාර' පිළිබඳ පෘථුලතම අර්ථ කථනය ඉදිරිපත් කළේ කවරෙක් ද?

(3) 'අලංකාර' පිළිබඳව 'භාමහ' ඉදිරිපත් කරන විවරණය 'දණ්ඩීන්' ඉදිරිපත් කරන විවරණයෙන් වෙනස් වන්නේ කවර කරුණු මත ද?

(4) 'අලංකාර' වශයෙන් බලන කල්හි 'යමක' හා 'රූපක' අතර වෙනස කුමක්ද?

(5) මේ ඡේදයෙහි සඳහන් වන 'කාව්‍යාංග' දෙකක් නම් කරන්න. (ලකුණු 2×5 = 10)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක්** පමණ වනසේ සාරාංශ කොට ලියා එහි වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

කුශලතාව යනු හැකියාවයි. එහෙත් සියලු හැකියාවන් කුශලතා යනුවෙන් හැඳින්විය නොහැකි ය. මනෝවිද්‍යාවේදී කුශලතා යන්නෙන් හැඳින්වෙන්නේ සංකීර්ණ වූ ද, කාල වශයෙන් රටාවක් සහිත වූ ද ක්‍රියාවන් නිපුණතා ලෙසත් නිරවද්‍ය ලෙසත් කිරීමට පුද්ගලයෙකුට ඇති හැකියාවයි. මෙබඳු හැකියාවක් ලබාගන්නේ පුහුණුව මගින් පුරුදු සමූහයක් ඇති කර ගැනීමෙනි. එදිනෙදා ජීවිතයේ බොහෝ කොට දක්නට ලැබෙන කුශලතාවලට නිදර්ශන ලෙස රිය පැදවීමේ හැකියාව, යතුරු ලිවීමේ හැකියාව ආදිය දක්වන්නට පුළුවන.

කුශලතා ගැන කරන අධ්‍යයනයේදී මනෝවිද්‍යාඥයෝ මූලික කුශලතා, උසස් මට්ටමේ කුශලතා යනුවෙන් දෙවර්ගයක කුශලතා පෙන්වා දෙති. මූලික කුශලතාවක් යනු සංකීර්ණ වූ කුශලතාවක සාර්ථකත්වයට මූලික පියවරක් වශයෙන් අත්‍යවශ්‍ය වන ප්‍රාථමික කුශලතාවයි. රිය පැදවීමේ කුශලතාව සඳහා අත්‍යවශ්‍ය වන සුක්කානම හැසිරවීමේ කුශලතාව එබඳු මූලික කුශලතාවකි. මූලික කුශලතා ගණනක් පදනම් කොටගෙන පවත්නා රිය පැදවීමේ හැකියාව උසස් මට්ටමේ කුශලතාවක් වේ.

බොහෝ විට මනෝ විද්‍යාඥයෝ කුශලතා යන පදය වෙනුවට වඩා විස්තරාත්මක වූ ඉද්‍රියචාලක කුශලතා යන පදය යොදති. පොදුවේ කුශලතා යනුවෙන් මනෝ විද්‍යාවෙහි හැඳින්වෙන්නා වූ හැකියාවන් පුද්ගලයාගේ ඉන්ද්‍රියයන් එකකට හෝ වැඩි ගණනක ක්‍රියාකාරීත්වය ද ඔහුගේ පේශි ආදී චාලක අවයවවල ක්‍රියා කාරිත්වය ද පදනම් කර ගැනීම මීට හේතුවයි. රිය පැදවීමේදී පුද්ගලයාට ප්‍රධාන වශයෙන් සිය දෘෂ්ටිය මගින් හා ස්පර්ශ මගින් ද, ශ්‍රවණය මගින් ද නිරන්තරයෙන් සංවේදන හා සංජානන ලැබෙයි. ඔහුගේ රිය පැදවීමේ කාර්යයට අවශ්‍ය වන චාලක ක්‍රියාවන් පදනම් වන්නේ මේ ඉන්ද්‍රිය දත්තයන් මත ය. (ලකුණු 15)

(03) දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300 350 අතර වන සේ ව්‍යාරණානුකූලව විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න.

(1) පරපුරෙන් පරපුරට රැක ගත යුතු අපේ සාරධර්ම

(2) රටක රැකියා අවශ්‍යතාවලට යෝග්‍ය වන අයුරින් උසස් අධ්‍යාපනය සකස් කිරීමේ වැදගත්කම

(3) පාරිසරික විනාශයන් ස්වභාවික ආපදා හා මනුෂ්‍ය ක්‍රියාකාරකම්

(4) වාණිජකරණය, තාක්ෂණීකරණය, ගෝලීයකරණය මත ගොඩ නැඟෙන නව සංස්කෘතික ප්‍රවණතා

(5) වර්තමාන ප්‍රජාවගේ ආහාර පුරුදු, ශාරීරික සෞඛ්‍ය අතර පවතින සබඳතාව

(6) වර්තමාන විද්‍යුත් මුද්‍රිත මාධ්‍යයන්හි මාධ්‍ය වගකීම (ලකුණු 25)

(04) (අ) පහත සඳහන් වාක්‍යවල <u>සදොස් තැන් ඇතොත් නිදොස් කොට</u> ලියන්න.

(1) හේ තෙමේ දක්ෂ ලෙස අභිනය දක්වමින් රැඟුමක යෙදුණාහ.

(2) ජනාධිපතිතුමා රටේ අභිවෘද්ධිය උදෙසා කැපවීමෙන් කටයුතු කළහ.

(3) සියලු රාජ්‍ය සේවකයෝ පිටිසර පළාත්වලින් සේවයට යොමු වී ඇත.

(4) තමා බැලීමට නෑදෑයෝ පැමිණෙතැයි රෝගීහු සිතූහ.

(5) තම පුතුගේ උසස්වීම පිළිබඳ ව දෙගුරුන් සතුටු වූහ. (ලකුණු 05)

(ආ) පහත සඳහන් <u>වාක්‍ය කර්මකාරකයට</u> හරවන්න.

(1) විනිසුරුවෝ විත්තිකරුවන් නඩුවෙන් නිදහස් කළහ.

(2) රසිකයෝ සම්මානලාභී නළුවා උණුසුම් ව පිළිගත්හ.

(3) වේදිකානාට්‍යකරුවෝ නව තේමා ඔස්සේ නාට්‍ය නිපදවීමට උනන්දු වෙති.

(4) සංස්කෘතික අමාත්‍යංශය කලා උළෙලක් සංවිධානයක කරයි.

(5) නව ලේකම්වරයා නිලධාරීන් ඇමතුවේය. (ලකුණු 05)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(1) සියලුම ............................................. (ගායකයෝ / ගායකයන්) වේදිකාවට පිවිසී නැත.

(2) උත්සවයට නොපැමිණි ............................................................. (බොහෝ දෙනෙක් / බොහෝ දෙනෙකු) සුබපැතුම් එවූහ.

(3) දරුවන් එහි .................................................. (පැමිණෙතියි / පැමිණෙහුයි) ගුරුවරු නොසිතුහ.

(4) ලිපිකරුවා ...................................................... (සහායකයින් / සහායකයෝ) සමග කාර්යාලය පිරිසිදු කරයි.

(5) මගේ පියා දක්ෂ ...................................................... (කවීකයෙක් / කවීකයෙකු) මෙන් ම ලේඛකයෙක් ද වේ. (ලකුණු 05)

(05 × 03 = 15)

(05) (අ) **පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් දක්වා** ඇති පදවල අර්ථ විග්‍රහ කර ලියන්න.

(1) විෂය ඉගෙනීමට අමතර ව ශිෂ්‍යයන් බාහිර ක්‍රියාකාරකම්වල යෙදවීමෙන් ඔවුන් **සමාජානුයෝජනයෙහි** යෙදවීම පහසු වනු ඇත.

(2) ත්‍රස්ත උවදුර **මූලෝත්පාටනය** කිරීමකින් විනා තුන්වන ලෝකයේ රටවල ස්වාධීනත්වය ඇති නොවේ.

(3) සිය **පාපෝච්චාරණය** සිදු කිරීමෙන් අනතුරු ව විත්තිකාරිය අධිකරණ ශාලාවෙන් පිටතට ගෙන යනු ලැබුවා ය.

(ලකුණු 03)

(ආ) පහත සඳහන් යෙදුම් වලට වඩාත් සුදුසු <u>තනිපදය ලියන්න.</u>

(1) ශබ්ද පිළිබඳ අර්ථ විග්‍රහය

(2) සිතින් මවාගත්

(3) කිසිවෙකුට දෙවෙනි නොවන (ලකුණු 03)

(ඉ) පහත දී ඇති වාක්‍යවල **හිස්තැනට වඩාත්ම ගැලපෙන පදය** වරහන් තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(1) සඳරැස් වැව්දිය මත ........................................................................ වෙද්දී කුමුදු පිබිදේ.

(2) ගහකොළ මල් සුළඟින් සැලී බිමට .............................................................. හඬ ඇසේ.

(3) හදිසියේ ම මා නෙත් ඇදී ගියේ ඉහළින් පියාසර කරන .................................. යානා දෙසටයි.

(4) රිය පුරා ම ........................................................................ පුරා තරු කැට මෝදු වෙමින් පැවතිණි.

(5) එදින උදයවරුවේ ........................................................... හා පිරිමි නෙළුමට කුඹුරට බැස්සෝ ය.

(6) වෘද්ධ අධ්‍යාපන සමිති හා ............................................................ සමිති එකල සමාජයේ බහුල ව පැවතුණු බව විශ්‍රාමික විදුහල්පතිවරයා පැවසීය.

(මහිලා / අඹර / ගැහැනු / ගගන / වැටෙන / පතිත)

(ලකුණු 03)

(ඊ) තද කළු අකුරින් දක්වා ඇති <u>බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස</u> වාක්‍ය බැගින් ලියන්න.

(1) තරු පෙළ **සඳ** වටා බබළමින් පැවතිණි.

(2) මා **ගත** කරන දිවිය සැබවින් ම දුෂ්කර ය.

(3) නංගී පිහි**තල** ගල ගාමින් ඒවා මුවහත් කරන්නට වෑයම් කළාය.

(4) **සරා** සළෙලු දනන්ගෙන් ඒ නුවර පිරී පැවතුණි.

(5) විහාරස්ථානයේ **නා** හිමි වැඩ නොසිටියේ ය.

(6) **කිතුනු**සමය ගැන ලියැවුණු බයිබලය ශුද්ධවූ ග්‍රන්ථයක් ලෙස කිතුනුවෝ අදහති.(ලකුණු 06)

(ලකුණු 3 + 3 + 3 + 6 = 15)

(06) තද කළු අකුරින් දක්වා ඇති පද කුමන ව්‍යාකරණ අංගයට අයත්දැයි දක්වන්න.

(1) අවට **සෞන්දර්යය** නරඹන ඔහු හදිසියේ ම **දේවතා** එළියක් දුටුවේ ය.

(2) ඇතැම් **උපදිසාපතිවරු** අතීතයේ **මෙන්** **සේවාස්ථානයේ** ම රැඳී සිටිති.

(3) **බොකුටු** හිසකේ ඇති **සුරඟන** බඳු රුව ඇති එම කත දුටුවන්ගේ **නෙත්සිත්** ඇදබැඳගත් බව නිසැක ය.

(4) **අන්වර්ථ** නාමයකින් හැඳින්වෙන **දේශපාලනඥයා** **උදෙසා** ගැයුණු ප්‍රශස්ති ඇතැමුන්ට **සරදමකි**.

(5) **විල්තෙර** ගැවසුණු පක්ෂීහු අශ්වාරෝහකයා දුටු සැණින් පියෑඹූහ. (ලකුණු 3 × 5 = 15)

(07) (අ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් හොඳින් ගැළපෙන **ප්‍රස්තාව පිරුළ** ලියන්න.

(1) පලිගැනීමට නොහැකි නිසා පිළිගැනීම.

(2) යම් ඵලයක් හට ගන්නේ යම් හේතුවක් උඩ බව.

(3) උද්සෝෂණයේ තරමට ප්‍රතිඵල නොලැබුණු බව

(4) ඉතා කලාතුරකින් යමක් සිදුවීම.

(5) කවර පැත්තක් ගනිම්දැයි සිතසිතා සිටීම.

(6) එක් කරදරයක සිට ඊට වඩා තවත් කරදරයකට වැටීම. (ලකුණු 03)

(ආ) පහත දී ඇති **රූඪීවල** අදහස පැහැදිලි වනසේ වාක්‍යවල යොදන්න.

(1) අමුකැවිලා

(2) කැලෑ නීතිය

(3) වවුල්වත

(4) පිඹුරු දඩයම

(5) පොරකටු ගෙවිලා

(6) අත දිග හැර (ලකුණු 03)

(ඉ) පහත දී ඇති එක් එක් යුගල පද සෑදී ඇති රටාව දක්වා එවැනි තවත් යුගල පද දෙකක් ලියන්න.

(1) පින්පව් (4) බඩුමුට්ටු

(2) කෙළිසෙල්ලම් (5) කාබී

(3) තක්කු මුක්කු (6) කුලීමලී (ලකුණු 03)

(ඊ) පහත දී ඇති ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න.

(1) අයිරුව (4) වයිතාලෙන්ම

(2) වෙහෙක්කම (5) වැවර

(3) පොල් ඔයනවා (6) දියදොස් (ලකුණු 03)

(උ) පහත දී ඇති ප්‍රාස්තාවික ව්‍යවහාරයන්ට දිය හැකි පොදු භාවිතයේ යෙදෙන අරුත් ලියන්න.

(1) වළාලය (4) අට හොඳයි

(2) පැණිඇට (5) සැහැල්ලුව

(3) ගයිගැට (6) පැඟිරිකොළ (ලකුණු 03)

(03 × 05 = 15)

(08) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සාමාන්‍යමිනිසෙකුටවඩාඕනෑමදෙයකසෞන්දර්යයදකින්නේකවියායඑයඅපූර්වකවියක්වන්නේඅපූර්වනිර්මාණයක්වන්නේකවියාඋචිතතැනටනහනධ්වනිතාර්ථමගිනිආනන්දවර්ධනනම්සංස්කෘතවිචාරකයාපවසාඇතිඅන්දමටධ්වනිතාර්ථවත්පද්‍යයලිවීමටහැකිතැනැත්තාමහාකවියෙකුලෙසසැලකියහැකිය.ඉදිරිපත්කරන්නාවුසිද්ධියකුමක්වුවදසුලබඑකක්වුවදසාමාන්‍යමිනිසෙකුටවඩාවෙනස්ආකාරයටඅලුත්ආකාරයටසියුම්ලෙසදැකීමේබැලීමේරසවිඳීමේහැකියාවඇත්තේකවියාටය.

(1) ඉහත ඡේදය නිවැරදි ව පද බෙදා, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න. (ලකුණු 07)

(2) ගැටය සහිත ඇලපිල්ල හා ගයනුකිත්ත සහිත පද දෙකක් ලියන්න. (ලකුණු 02)

(3) මේ ඡේදයේ පාපිලි යෙදී ඇති පද දෙකක් ලියන්න. (ලකුණු 02)

(4) මේ ඡේදයේ 'සංස්කෘත' යන පදයෙහි ඇතුළත් පිල්ලම් නම් කරන්න. (ලකුණු 02)

(5) මේ ඡේදයේ ඇතුළත් නොවන රකාරාංශය හා රේඵය සහිත පද දෙකක් ලියන්න. (ලකුණු 02)

(ලකුණු 15 යි.)